# අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 27 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) ගිණුම් තැබීමේ කටයුතු සඳහා යොදා ගෙන තිබූ ජර්නල් සටහන් වලට අදාල ගනුදෙනු පහසුවෙන් හඳුනාගත හැකිවන පරිදි ප්‍රමාණවත් තොරතුරු හා යොමු විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි විදුලි උපකරණ තොගය රු. 37,475 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 160,944 ක් වූ වීථි පහන් නඩත්තු මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු. 39,450 ක්වූ ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් සේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වැය ශීර්ෂයන් 06 කට අදාලව දරන ලද රු. 832,191 ක වියදම්, අදාල වැය ශීර්ෂයන්ට හර කරනු වෙනුවට වෙනත් වැය ශීර්ෂයන්ට හර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් සභාවේ පුස්තකාලයට ලැබී තිබූ පොත් 59 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සභා රැස්වීම් ශාලාව සඳහා මිලදී ගෙන තිබූ රු. 725,786 ක් වූ ලීබඩු හා උපකරණවල වටිනාකම රු. 502,697 ක් ලෙස රු. 223,089 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණය හිමියන් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේදී , වර්ෂය තුලදී ගෙවන ලද රු. 1,748,500 ක මුදලද ඇතුලත්ව තිබීම නිසා ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි . ණයහිමි වෙන්කිරීම්ද එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී විවිධ ණයගැතියන්ගෙන් රු. 7,946,931 ක මුදලක් ලැබී ප්‍රාග්ධන ආධාර (3.80) ගිණුමට බැර කර ඇති බව නිරීක්ෂණය වුවද ජර්නල් සටහන් 17 අනුව එකී ගිණුමට හරකර ණයගැති ගිණුම බැරකර තිබුණේ රු. 5,612,320 ක මුදලකි. ඒ අනුව ණයගැති ලැබීම් රු. 2,334,611 ක මුදලක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 05 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 1,836,396 ක්වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 1,684,692 ක් විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම</u>

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම්වල බැර ශේෂවල එකතුව රු. 665 ක් විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර , එකී විමසුම් වලට භාජනය වු ගණනය කල හැකි ගණුදෙනු වල වටිනාකම රු. 2,386,133 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

ශේෂ සනාථ කිරීම් , විස්තරාත්මක උපලේඛන ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 69,709,242 ක්වු වත්කම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>අනුකූල නොවීම්.</u>

පහත දැක්වෙන නීති ,රීති , රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) <u>1988 ප්‍රාදේශීය සභා (මල්‍ය හා පරිපාලන) රීති මාලාව</u>

(i) රීති 164 ප්‍රකාර සභාවේ ගිණුම් ලියකියවිලි , ලේකම් හෝ ඔහු විසන් බලය පවරන ලද නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කොට ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කළයුතුව තිබුණද එසේ කර නොතිබුණි.

(ii) රීති 188 ප්‍රකාර සියළුම ණය හා ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන් පි.එස්. 44 ආකෘතියට අනුව ලේඛනයක් පැවැත්විය යුතු වුවද සභාව විසින් දේශිය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 9,391,943 ක ණය සම්බන්ධයෙන් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි.

(iii) රීති 218 ප්‍රකාර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.</u>

(i) මු.රෙ. 138 ප්‍රකාර ගෙවීම් වවුචර් සහතික කරන බලධාරියකු විසින් වවුචර්වල අත්සන් කර වියදම සහතික කල යුතු වුවත් සමහර වවුචර්වල වියදම් සහතික කරන නිලධාරියා අත්සන් කර නොතිබුණි.

(ii) මු.රෙ. 139 (7) ප්‍රකාර ගෙවීම් වවුචරය මතුපිට දක්වා ඇති ශුද්ධ මුදල විධිමත් පරිදි ගෙවන බව හා එම ගෙවීම් කල බවට "ගෙවන ලදි" මුද්‍රාව වවුචරය මත යොදා බලයලත් නිලධාරියකු කෙටි අත්සන් කලයුතු වුවද ඇතැම් වවුචර් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

(iii) මු.රෙ. 371 (2) ප්‍රකාර යම් කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලට අදාලව දෙන ලද රු. 829,234 ක්වූ අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

(iv) මු.රෙ. 396 (ඇ) ප්‍රකාර රු. 13,537 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් යොමු ගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(v) මු.රෙ. 1645 හා1646 ප්‍රකාර වාහන 06 කට අදාලව මාසික වාහන සංසිද්ධි සාරාංශ සමඟ දෛනික ධාවන සටහන් පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී එසේ කර නොතිබුණි.

02. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 3,363,687 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 1,456,805 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය.

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| බදුකුළී | 5,034 | 5,012 | 70 | 4,123 | 4,113 | 68 |
| බලපත්‍ර ගාස්තු | 352 | 325 | 103 | 261 | 223 | 76 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 3,537 | 202 | 3,300 | 3,295 | 1,195 | 2,511 |
| වෙනත් ආදායම් | 2,463 | 2,268 | 194 | - | - | - |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 2,656,337 ක දඩ මුදල සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු.

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු. 643,245 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 හිඟ හිරි වෙළඳ බලපත්‍ර ගාස්තු.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියප්‍රකාර හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු විධිමත් පරිදි අයකර නොගැනීම නිසා 2010 දෙසැම්බර් 31 දිනට රු. 102,050 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

### 2.2.5 හිඟ කඩ කාමර කුලී

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තියප්‍රකාර හිඟ කඩ කාමර කුලී අයකර නොගැනිම නිසා 2010 දෙසැම්බර් 31 දිනට රු. 21,302 ක කඩ කාමර කුලී මුදලක් අයවිය යුතුව තිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 9,167 | 9,635 | (468) | 9,152 | 8,613 | 539 |
| අනෙකුත් | 3,498 | 5,890 | (2,392) | 3,405 | 4,360 | (955) |
| උප එකතුව | 12,665 | 15,525 | (2,860) | 12,557 | 12,973 | (416) |
| ප්‍රාග්ධන වියදම් | 2,900 | 67,305 | (64,405) | 3,140 | 93,520 | (90,380) |
| මුළු එකතුව | 15,565 | 82,830 | (67,265) | 15,697 | 106,493 | (90,796) |

2.4 අධිභාර

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යවස්ථාපිත විධි විධානයන්ට අනුකූලව මව්සින් 1975 - 1988 කාලය තුළදී නිකුත් කරන ලද අධිභාර 07 ක් වෙනුවෙන් අයවිය යුතුව තිබූ මුදල රු. 24,662 ක් විය.

2.5 මානව සම්පත් කළමණාකරණය

2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 08 | 12 |
| ප්‍රාථමික | 13 | 13 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 14 |

(ආ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 , 2006 මැයි 10 දිනැති අංක 28 (i) හා 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව විධිමත් අනුමැතියක් නොමැතිව සභාව විසින් අනියම් හා තාවකාලික සේවකයින් 14 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි.

2.6 වත්කම් කළමණාකරණය.

2.6.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 23,990,696 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 400,475 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 1,403,281 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවන ලද ගිණුම් ශේෂවල අගය රු. 228 ක් විය.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 03 ගෙන් 2010 දෙසැම්බර් 31 දිනට රු. 89,782 ක් අයවිය යුතුව තිබුණි. එකී සේවක ණය ශේෂ එකවර අයකර ගතයුතුව තිබුණද, වාරික වශයෙන් අයකරගනු ලබන බව නිරීක්ෂණය විය.

2.6.3 අචල ජංගම වත්කම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කට වඩා වැඩි කාලයක් තිස්සේ නිකුත් නොවී පවතින නළ ළිං උපකරණ වල අගය රු. 58,018 ක් විය.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(i) 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සහ ඒ සම්බන්ධයෙන් වූ 1994 පෙබරවාරි 18 දිනැති අංක 04/1994 දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි සභාවේ මන්ත්‍රීවරු 09 දෙනෙකු 2010 වර්ෂය සඳහා ඉහත ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ii) විදුලි කාර්මික, විදුලි පහන් නිකුත් කිරීමට අදාල නිකුත් කිරීම් නියෝගවල පහන් සවිකිරීමට නියමිත ස්ථාන පිළිබඳ දක්වා නොතිබුණු අතර, ඔහු විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවල , එකී පහන් සවිකල බව සනාථ කර ගැනීමට වගකිව යුතු නිලධාරියකු අධීක්ෂණය කර තහවුරු කර නොතිබුණි.

(iii) 2010 වර්ෂය තුල මිලදී ගන්නා ලද ප්‍රතිදීප්ත පහන් 480 න් 335 ක් දෙසැම්බර් මස තුලදී විදුලි කාර්මිකට නිකුත් කර තිබුණි. එයින් පහන් 47 ක් සවිකල බවට වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර, ඉතිරි පහන් 288 සවිකල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

2.8 <u>වාහන පාලනය</u>

(i) අංක 252 - 6468 දරණ කැබ්රථය 2010 දෙසැම්බර් 28 දින සිට 2011 ජනවාර් 14 දින දක්වා කි.මී. 2994 ක් ධාවනය කර තිබුණු අතර, ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, රු. 14,367 ක් වටිනා ඩීසල් ලීටර් 196 ක් නිකුත් කලද ධාවන සටහන් වල ඒවා ඇතුලත් කර නොතිබුණි.

(ii) අංක 53 - 5713 දරණ කැබ්රථය සඳහා 2011 ජනවාර් 04 හා 05 දෙදින තුළ රු. 5,131 ක් වටිනා ඩීසල් ලීටර් 70 ක් නිකුත් කර තිබුණද ඒවා ධාවන සටහන්වල ඇතුලත් කර නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයට අයත් වීරගස්වැව මාර්ගය පිළිසකර කිරීම සඳහා 2011 ජනවාර් 05 දින පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහනකට පිටතින් ලබාගත් ට්‍රැක්ටර් රථ 09 ක් සඳහා ඉන්ධන ලීටර් 480 ක් සභාවෙන් නිකුත් කර තිබුණි. එකී කර්මාන්තය වගකිව යුතු නිලධාරියකු විසින් අධීක්ෂණය කර සහතික කර නොතිබුණු අතර, කාර්මික නිලධාරියකු විසින් පූර්ව ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

2.9 අවිධිමත් ගනුදෙනු
---------------------

(i) සභා අරමුදලින් රු. 130,662 ක් වැයකර කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගෙන තිබු අතර, ගජබා නම් ගොවි සංවිධානයකට මසකට රු. 9,000 බැගින් කුලී අයකර ගැනීමේ පදනම මත 2010 සැප්තැම්බර් මස ලබාදී තිබුණි. එහෙත් ඒ සඳහා විධිමත් පරිදි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණ අතර, කුලියට දීම සම්බන්ධයෙන් සභා තීරණයක්ද ගෙන නොතිබුණි.

(ii) මෙම යන්ත්‍රය ගජබා ගොවි සංවිධානයට ලබාදී තිබුණද ඒ බවට ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර, එකී සංවිධානය බාරගත් බවටද සටහනක් නොවීය.

2.10 <u>පොත්පත් හා ලේඛණ පවත්වා නොතිබීම.</u>

සභාව විසින් පවත්වා ගෙන යායුතු පොත්පත් හා ලේඛණ 06 ක් විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණි.

2.11 <u>ප්‍රතිපාදන ඌන උපයෝජනය</u>

2010 වර්ෂයේ අයවැය ලේඛනය අනුව වැය ශීර්ෂ 04 කට අදාලව ඇස්තමේන්තු කරන ලද රු. 26,000 ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදි වැයකර නොතිබුණි.

2.12 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) ගබඩා පාලනය